චක්‍රලේඛ අංක - PRE/2024/40

TR - 05

මගේ අංකය: TR/PRE/CIR/2024
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2024.08.18

සියළුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් සහ
නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,

**ජනාධිපතිවරණය - 2024.09.21**

**කුලී පදනම මත වාහන ලබාගැනීම හා ගෙවීම් කිරීම.**

2024.09.21 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේදී ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රවාහන අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා හැකි පමණ රජයේ වාහන යොදා ගැනීමට කරුණාකර කටයුතු කරන්න.

02. ඡන්ද පොළවල් වෙත යවනු ලබන කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීම සඳහා හැකිතාක් දුරට රජයේ වාහන ද ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් රථ හා පෞද්ගලික බස්රථ ද යොදා ගත යුතුය. තවද ඔබගේ අනුමැතිය සහිතව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් රැගෙන එන පෞද්ගලික වාහන ද මේ සඳහා යොදා ගත හැකිය. එහෙත් මෙම සියළු වාහන ප්‍රමාණවත් නොවන අවස්ථාවකදී ඡන්ද විමසීමේ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරීමට සහ කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා පමණක් කුලී ගෙවීම් පදනම මත ඔබගේ දිස්ත්‍රික්කය තුලින් පෞද්ගලික වාහන ලබා ගැනීමට කටයුතු කළ හැකිය. මෙසේ ලබා ගන්නා වාහන පූර්ණ රක්ෂණය සහිත වාහන විය යුතු වුවද අවශ්‍යතාව මත තුන්වන පාර්ශවීය රක්ෂණය සහිත වාහන ද යොදා ගත හැකිය. එහෙත් කිසියම් අනතුරකදී හෝ අලාභයකදී මැතිවරණ කොමිෂන් සභාව ඊට කිසිසේත් මැදිහත් නොවන බවට ඔවුන්ව ලිඛිතව දැනුවත් කළයුතු වේ. ඊට ඔවුන්ගේ ලිඛිත එකඟතාව ද ලබාගත යුතුය.

03. ඔබ විසින් ලබා ගන්නා කුලී වාහන සඳහා පහත සඳහන් ගාස්තු යටතේ ගෙවීම් කළ හැකිය.

| කි.මී.1 ක් සඳහා අනුමත ගාස්තු | | |
|---|---|---|
| වාහන වර්ගය | පෙට්‍රල් වාහන | ඩීසල් වාහන |
| ආසන 08 ට අඩු වෑන්/ජීප් | රු. 125.00 | රු.120.00 |
| ආසන 08 - 14 ත් අතර වාහන | රු. 130.00 | රු.140.00 |
| ආසන 15 - 25 අතර වාහන | - | රු.150.00 |
| ආසන 26 - 39 අතර වාහන | - | රු.160.00 |

මෙසේ ලබාගන්නා වාහන සඳහා ඉහත සඳහන් ගාස්තු වලට අමතරව තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කළ වේලාවේ සිට තේරීම්භාර නිලධාරී විසින් වාහනය මුදාහල වේලාව දක්වා වූ කාල සීමාවට රඳවා ගැනීමේ ගාස්තුව වශයෙන් පැයකට රුපියල් 100.00 ක මුදලක් ගෙවිය හැක.

කිසියම් විශේෂිත අවස්ථාවක ඉහත සඳහන් වාහන වලට අමතරව කුලී පදනම මත කැබ් රථ හා කාර් රථ ලබා ගැනීමේ අවශ්‍යතාවක් ඇති වුවහොත් ඒ සඳහා මිළ ගණන් ද ලබාගෙන එම මිළ ගණන් සම්බන්ධයෙන් ඔබගේ නිර්දේශය ද සමග මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය සඳහා යොමුකළ යුතුය.

මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය ලැබීමෙන් පසු එසේ ලබාගන්නා කැබ් රථ හා කාර් රථ රාජකාරීන්හි යොදවන ලද ආකාරය පිළිබඳව තොරතුරු සටහන් කර තබාගත යුතු අතර ඡන්ද විමසීම නිමවීමෙන් පසු එකී තොරතුරු මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු වේ.

04. ඔබ දිස්ත්‍රික්කය තුළ පිහිටි ඡන්ද මධ්‍යස්ථාන සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට වාහන ලබා ගැනීමේදී හැකිතාක් ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශය තුලින්ම කුලී පදනම මත හෝ වාහන සපයා ගැනීම මගින් රියදුරන්ට නවාතැන් පහසුකම් , ආහාර පාන ආදිය ලබාදීමේ ගැටළු අවම කර ගත හැකිවනු ඇත. එසේ කටයුතු කිරීමෙන් පසු තවදුරටත් වාහන අවශ්‍ය නම් පමණක් කොළඹ සංචිතයෙන් වාහන ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

05. තවද කුලී පදනම මත ලබා ගන්නා වෑන් රථ සඳහා කිලෝමීටරයකට ගෙවනු ලබන අනුමත ගාස්තු ප්‍රමාණයට අමතරව දින දෙකක් සඳහා රියදුරු සඳහා වූ ගෙවීමක් ලෙස දිනකට රු.750.00 ක් බැගින් (ඡන්ද විමසීම් දිනට පෙර දින හා ඡන්ද විමසීමේ දින) රු.1,500.00 ක විශේෂ දීමනාවක් ගෙවිය හැකිය. මෙම දීමනාව ආසන 26 ට වැඩි වාහන සඳහා යොදවා ගන්නා රිය සහයකවරුන්ට ද ගෙවිය හැකිය.

06. තවද කුලී පදනම මත සේවයේ යොදවාගනු ලබන වාහන වලට එම වාහන නවතා තබා ගැනීමේ ස්ථානයේ සිට දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ගේ කාර්යාලය වෙත වාර්තා කිරීමට හා මුදා හැරීමෙන් පසු ආපසු රැගෙන යාම සඳහා ද දිස්ත්‍රික්කය තුළ ධාවනය කිරීමට සිදුවන කිලෝමීටර් ගණන ද මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කර තිබිය යුතුය. මේ සඳහා සුදුසු ආකෘතියක් හෝ ලේඛනයක් ඔබ විසින් පවත්වාගෙන යාම වඩාත් සුදුසු වේ.

07. කුලියට ලබාගත් වාහන තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කිරීමෙන් අනතුරුව ගතවූ මුළු කාලය තුලදී යටත් පිරිසෙයින් කි.මී.50 ක් හෝ ධාවනය නොවූ අවස්ථාවකදී එම වාහන සඳහා කි.මී.50 ක් සඳහා වූ අවම ගාස්තුවක් ගෙවිය හැකි අතර කි.මී.50-100 දක්වා ධාවනය වූ අවස්ථාවලදී එම වාහන සඳහා කි.මී.100 ක් සඳහා ද කි.මී.100 ට වැඩියෙන් ධාවනය වන අවස්ථාවලදී ධාවනය කල දුර ප්‍රමාණයට ද ගාස්තු ගෙවිය යුතුවේ. ඊට අමතරව ඉහත 03 ඡේදයේ සඳහන් රඳවා ගැනීමේ ගාස්තුව ද එක් එක් අවස්ථාවලට අනුව ගෙවිය යුතුය. එහෙත් වාහනය කාර්මික දෝෂයක් හෝ වෙනත් හේතුවක් නිසා ධාවනය කළ නොහැකි වී නම්, එම වාහන සඳහා කිසිදු ගාස්තුවක් නොගෙවිය යුතුය.

08. ඡන්ද පොළ නිලධාරීන් ප්‍රවාහනය සහ කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් සඳහා හැර සුභ සාධක කටයුතු ආදී වෙනත් අවශ්‍යතා සඳහා කුලී වාහන යොදා නොගත යුතුය.

09. ඔබගේ අනුමැතිය සහිතව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් රැගෙන එන වාහන සඳහා ඉදිරියේදී නිකුත් කරනු ලබන මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රවාහන චක්‍රලේඛයෙන් අනුමත කර ඇති ගාස්තු ප්‍රමාණයන් යටතේ ද, කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් රැගෙන එන වාහන සඳහා ආයතන සංග්‍රහයේ දැක්වෙන සීමාවන්ට අනුව සැතපුම් කුලී ගෙවීම ද සිදුකරනු ලබන බව ඔවුනට දැනුම් දෙන්න. (එම ගෙවීම් සඳහා මෙම චක්‍රලේඛය අදාළ නොවේ.)

10. කුලී වාහන ලබා ගැනීම, ධාවනයේ යෙදවීම හා ඒ සඳහා ගෙවීම් නිර්දේශ කිරීම නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ අධීක්ෂණය යටතේ සිදුවිය යුතු අතර, මෙම වාහන සම්බන්ධ පහත දැක්වෙන තොරතුරු ලේඛනයක සටහන් කරවීමට ද කරුණාකර විධි විධාන යොදන්න.

I. වාහන අංකය
II. වාහනයට යොදන ඉන්ධන වර්ගය
III. අයිතිකරුගේ නම සහ ලිපිනය
IV. වාහනයේ ආසන ගණන (රියදුරු අසුන හැර)
V. ඡන්ද විමසීමේ කටයුතු සඳහා වාර්තා කළ දිනය හා වේලාව
VI. මුදාහල දිනය හා වේලාව
VII. ධාවනය කල කිලෝමීටර් ගණන ( වාහන රැගෙන ඒම හා රැගෙන යාම සඳහා ධාවනය කළ යුතු කි.මී. ගණන ද ඇතුළුව)
VIII. ධාවනය සඳහා ගෙවූ මුදල
IX. රඳවා ගැනීමේ කාලය සඳහා ගෙවූ මුදල

X. රියදුරු සඳහා ගෙවූ විශේෂ දීමනාව

XI. සේවයේ යෙදවීම අනුමත කළ නිලධාරියාගේ නම අත්සන හා නිල නාමය

11. කුලී පදනම මත වාහනය ලබාගන්නා අවස්ථාවේදීම මෙම චක්‍රලේඛයට අනුකූලව ගෙවනු ලබන ගාස්තු දැක්වෙන ලිපියක් වාහන හිමියන්ට නිකුත් කරන්න. තවද ගෙවීම් කිරීම සඳහා බිල්පත් ඉදිරිපත් කළයුතු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නම හා ලිපිනය ද එම ලිපියේ අඩංගු කිරීමට කරුණාකර කටයුතු කරන්න.

12. ඡන්ද විමසීම අවසන්ව මාසයක් ඇතුළත ඔබ ලබාගන්නා කුලී වාහන වලට ගෙවීම් කටයුතු අවසන් කළයුතු අතර එසේ ගෙවීම් කටයුතු අවසන් වූ පසු ඉහත 10 වන ඡේදයේ සඳහන් ලේඛනය නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් භාරයේ තබා ගත යුතුය.

13. කුලී පදනම මත ලබාගන්නා වාහනවලට ගෙවීම් කරනුයේ අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් බවද එම ගෙවීම් වෙනත් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකට හෝ මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත හෝ ඉදිරිපත් නොකරන ලෙස ද ඔවුන්ට උපදෙස් දෙන්න.

14. තවද චක්‍රලේඛ අංක PRE/2024/39 හි උපදෙස් අනුව ශ්‍රී ලංකා පොලිසියට හා ආරක්ෂක හමුදාවල අවශ්‍යතාවන් සඳහා කුලියට ගනු ලබන වාහනවලට ද මෙම ගාස්තු යටතේ ශ්‍රී ලංකා පොලිසිය වෙත වෙන්කර දෙනු ලබන ප්‍රතිපාදන තුලින් ගෙවීම් කළයුතු වේ. කෙසේ වෙතත් ලබා ගන්නා වාහන අදාළ මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කරවීම අනිවාර්ය බව කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ/ පොලිස් අධිකාරීවරුන්ට දැන්වීමට ක්‍රියාකරන ලෙස වැඩිදුරටත් දන්වමි.

සමන් ශ්‍රී රත්නායක ,
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත්:

1. පොලිස්පති - මැතිවරණ කටයුතු සඳහා ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍යවන පුද්ගලික කුලී වාහන, චක්‍රලේඛ අංක PRE/2024/39 සහ මෙම චක්‍රලේඛයෙන් ලබාදී ඇති උපදෙස් හා ගාස්තු ප්‍රමාණයන් යටතේ ලබා ගැනීමට කටයුතු කළ හැක. ඒ සඳහා ගෙවීම් කළයුත්තේ ශ්‍රී ලංකා පොලිසිය වෙත වෙන්කර දෙනු ලබන ප්‍රතිපාදන වලිනි.
2. විගණකාධිපති
3. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
4. ප්‍රධාන මූල්‍ය නිලධාරි
5. ප්‍රධාන ගණකාධිකාරී
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක

(2–6) කාරුණික දැන ගැනීම පිණිස